# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2016 මාර්තු මස 11 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2016.03.14 දින නිකුත් කරන ලදී)**


# ශ්‍රී ලංකා අභ්‍යන්තර සැලසුම්කරුවන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන)

(පෞද්ගලික මන්ත්‍රීවරයකුගේ පනත් කෙටුම්පතකි.)

**1998 අංක 2 දරන ශ්‍රී ලංකා අභ්‍යන්තර සැලසුම්කරුවන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

මහනුවර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මයන්ත දිසානායක මහතා විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

**මිළ : රු. 6.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

# ශ්‍රී ලංකා අභ්‍යන්තර සැලසුම්කරුවන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන)

**1998 අංක 2 දරන ශ්‍රී ලංකා අභ්‍යන්තර සැලසුම්කරුවන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මෙම පනත 2016 අංක දරන ශ්‍රී ලංකා අභ්‍යන්තර සැලසුම්කරුවන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය.

2. මෙම යෝජිත පනතේ අරමුණ වන්නේ, පහත දැක්වෙන කොටස් එකතු කිරීම සඳහා සංස්ථාවේ සාමාන්‍ය බලතල යටතේ පනතේ 4 වන වගන්තිය සංශෝධනය කර ලීමයි :—

(1) සංස්ථාවේ සාමාජිකත්වය, අභ්‍යන්තර සැලසුම්කරණ ක්ෂේත්‍රයේ සියලු පරිචායකයින් (සේවා නියුක්ති වෘත්තිකයින්) සඳහා වන අවශ්‍යතාවය වන අතර වෘත්තිවේදී තත්ත්වය පිළිගැනීමක් හා අභ්‍යන්තර සැලසුම්කරු, අභ්‍යන්තර ගෘහ නිර්මාණ ශිල්පී (වාස්තු විද්‍යාඥ), අභ්‍යන්තර තාක්ෂණඥ සහ අභ්‍යන්තර අලංකාරකයන් (විභූෂකයින්) සඳහා පරිචයක (සේවා නියුක්ති) බලපත්‍රයක් ද වන අතර එය අවශ්‍යතා සම්පූර්ණ කෙරෙන, සංස්ථාවේ අනුමැතිය ලබාගත් හා නීති රෙගුලාසි සහ ආචාර ධර්ම පද්ධතියට අනුකූලව ක්‍රියාකරන අය සඳහා වේ;

(2) සංස්ථාව, අභ්‍යන්තර සැලසුම්කරණ ක්ෂේත්‍රයේ වරලත් තත්ත්වය (වරලත් අභ්‍යන්තර සැලසුම්කරු), පිළිගැනීමක් ලබා ගැනීම සඳහා සුදුසුකම් හා විශේෂඥතාවය සහිත අය හට එම තත්ත්වය ප්‍රදානය කරලීම සඳහා වගකීම දරන ආයතනය වේ);

(3) සංස්ථාව මනා සැලසුම්කරු වටිනාකමක් හා නිෂ්පාදන තත්ත්වයක් සහිත එවන් අභ්‍යන්තර නිපැවුම් සඳහා වෙළඳපල පිළිගැනීම සඳහා වන තත්ත්ව ආරක්ෂණ සහතිකයක් ලබාදෙනු ඇත;

1998 අංක 2 දරන ශ්‍රී ලංකා අභ්‍යන්තර සැලසුම් කරුවන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනතේ 4 වන වගන්තිය වන සංස්ථාවේ සාමාන්‍ය බලතල සංශෝධනය කිරීම.

(4) සංස්ථාවේ නිර්දේශය, අභ්‍යන්තර අලංකරණ සහ අභ්‍යන්තර තාක්ෂණවේද ක්ෂේත්‍රයේ තාක්ෂණික කුසලතා පිළිබඳ නිපුණතාවය සඳහා සහතික පත්‍ර පිරිනැමීම සඳහා අවශ්‍ය වනු ඇත;

(5) සංස්ථාව, අභ්‍යන්තර සැලසුම්කරණ අධ්‍යාපනය පිළිබඳ ඉහළ ප්‍රමිතීන් තහවුරු කරලීම සඳහා විෂය ධාරාව සංවර්ධනයට සහය වනු ඇත.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

3. මෙම පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.